**කොළොන්නාව නගර සභාව - 2023**
**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොළොන්නාව නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කොළොන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියේ අංක 3.29 ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ (කෙරීගෙන යන වැඩද ඇතුළුව) මිලදී ගැනීම් රු.98,629,078 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ එය රු.110,191,846 ක් ලෙස රු.11,562,768 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. ඉදිරියේදි ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රමිතියේ අංක 3.29 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී වත්කම් විකිණීමෙන් ලද මුදල වූ රු.15,700 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගළපා නොතිබුණු අතර, වත්කම් ඉවත් කිරීමේ අලාභය රු.552,982 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගැලපුම් යටතේ දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | වර්ෂය සඳහා වූ ක්ෂය රු.53,303,651 ක් වුව ද ප්‍රමිතියේ අංක 3.32 ප්‍රකාරව එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට රු.53,272,266 ක් ලෙස රු.31,385 ක් අඩුවෙන් ගළපා තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | ප්‍රමිතියේ අංක 3.29 ප්‍රකාරව ආයෝජන ආදායම රු.23,443,578 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ගලපා නොතිබුණි. | පිළිගනිමි. ඉදිරියේදි ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කළ යුතු රු.64,530,340 ක් ගොඩනැගිලි ගිණුමට හර කර තිබුණි. | 2024/JE/2 මගින් නිවැරදි කිරිමට කටයුතු කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | යන්ත්‍ර ගිණුමට හර කළ යුතු රු.162,166 ක් බදුන් හා උපකරණ ගිණුමට හර කර තිබුණි. | 2024/JE/3 මගින් නිවැරදි කිරිමට කටයුතු කර ඇති බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය වියදම රු.319,691 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | පිළිගන්නා බව | -එම- |
| (ඈ) | 2022 වර්ෂය සඳහා ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර නොතිබුණු මස්කඩ කුලී ලැබීම් රු.1,653,175 ක් සමුච්චිත අරමුදලට බැරකරනු වෙනුවට තැන්පතු ගිණුමට බැර කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | -එම- |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශන සඳහා ණයහිමියන් ගිණුම්ගත කිරීමේදී ණයහිමියන් 03 දෙනෙකුගේ වටිනාකම රු.419,815 ක් අඩුවෙන්ද, ණයහිමියන් 04 දෙනෙකුගේ වටිනාකම රු.54,665 ක් වැඩියෙන්ද දක්වා තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂ 06 ක වටිනාකම රු.2,065,714 ක් දක්වා නොතිබුණි. | -එම- | -එම- |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| හඳුනා නොගත් ශේෂ | 40,932,285 | හඳුනානොගත් ශේෂ සඳහා අනුමැතිය සහ විස්තරාත්මක උපලේඛණය | කඩිනමින් නිරවුල් කර ඉදිරිපත් කරන බව. | අදාල අනුමැතිය සහ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරණ වරිපනම් හා තක්සේරුකරණ ආඥා පනතේ 20 වගන්තිය | වර්ෂ 05කට වරක් තක්සේරු කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට නව වරිපනම් බදු තක්සේරුව ක්‍රියාත්මක කර ඇති බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | සභාව සතු වාහන 28 ක ඉන්ධන දහනය පරීක්ෂා සිදුකර නොතිබුණි. | පිළිගනිමි. ඉදිරියේ දී පරීක්ෂා කරන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | අංක 26/92 හා 1992 අගෝස්තු 19 දිනැති හා අංක 01/2002 හා 2002 පෙබරවාරි 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාවට අයත් වාහන 07 ක රාජ්‍ය ලාංඡනය සහ ආයතනයේ නම වාහන බඳෙහි සටහන් කර නොතිබුණි. | පිළිගනිමි. රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම බඳෙහි සටහන් කර නොමැති වාහන වල එය සටහන් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

**1.7.2 බදු අවශ්‍යතාවයට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගෙවිය යුතු එකතු කළ අගය මත බදු ශේෂය ලෙස රු.1,278,234ක් හඳුනා නොගත් ශේෂ ලෙස දක්වා තිබුණි. | රු.1,278,234 වැට් ශේෂය සම්බන්ධව දේශීය ආදායම් කොමසාරිස් වෙතින් විමසා ඉදිරි කටයුතු සිදු කරන බව. | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.34,263,400 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු.71,698,962 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 100,000,000 | 92,623,581 | 86,617,771 | 79,421,106 | 93,000,000 | 93,136,471 | 80,591,014 | 75,122,890 |
| (ii) කුලී | 11,252,616 | 11,444,682 | 10,435,416 | 10,092,266 | 12,117,142 | 12,117,142 | 9,783,082 | 2,334,060 |
| (iii) බලපත්‍ර ගාස්තු | 600,000 | 721,000 | 721,000 | - | 601,000 | 601,000 | 601,000 | - |
| (iv) වෙනත් ආදායම් | 6,521,028 | 5,659,527 | 5,659,527 | - | 6,485,000 | 7,095,252 | 7,095,252 | - |
| එකතුව | 118,373,644 | 110,448,790 | 103,433,714 | 89,513,372 | 112,203,142 | 112,949,865 | 98,070,348 | 77,456,950 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණන නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟහිටි වරිපනම් හා බදු වටිනාකම රු.79,421,106 ක් වූ අතර එයින් රු.40,000 කට වඩා වැඩි හිඟ වටිනාකමක් ඇති වරිපනම් හිඟ ශේෂ 45 කින් අයවිය යුතුව තිබූ මුදල රු.24,668,316 ක් විය. | රු.40,000/-ට වැඩි හිග වරිපනම් රු.24,668,316 න් රු.5,122,946 ක් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර, ඉතිරි හිඟමුදල් ද 2024 මැයි මස සිට දේපල තහනම් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර අය කර ගන්නා බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාවට අයත් කඩ කාමර 187 කින් ලැබිය යුතු ශේෂය රු.7,016,695 ක් විය. | මෙම හිඟ මුදල ඇති වීමට හේතුව ඔරුගොඩවත්ත අඹතලේ මාර්ගය පුළුල් කිරිමේ ව්‍යාපෘතිය හේතුවෙන් ගොඩනැගිලි සංකීර්ණ 02 ක් කඩා ඉවත් කිරිමට යෝජනා වි තිබීම හේතුවෙනි. නවවෙළඳ ස්ථාන ලබා දීමේදි හිඟ මුදල් අයකරගෙන ලබා දීමට සැලසුම් කර ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.120,000,000 ක් විය. | 2022 වර්ෂයට ඇස්තමේන්තු කළ රු.120,000,000 ක් ඔප්පු හුවමාරු මුද්දර ගාස්තු ආදායම වේ. මෙම වර්ෂයේදී (2024) මේ වන විට ඉන් රු.6,781,796.00 මුදලක් ලබා ගෙන ඇති බව. | ලැබිය යුතු මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් පරිහරණය කරනු ලබන ප්‍රත්‍යාගණන වටිනාකම රු.3,706,300,000 ක් වූ ඉඩම් 21 ක් සඳහා හිමිකම් ඔප්පු නොතිබුණි. | නගර සභාව සතු දේපළ සංඛ්‍යාව 39 අතරින් දේපළ 5 කට හිමිකම් සහතික හා මානක සැලැස්ම ඇති බැවිනි. දේපළ 31 ක් සඳහා මානක සැලැස්ම හා හිමිකම් සහතික නැති බවත් මෙම සභාව භුක්ති විදින සියළුම දේපල නගර සභාව වෙත පවරා දෙන ලෙස පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශ සහිතව ප්‍රාදේශිය ලේකම් වෙත යවා ඇති බව. | ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු වාහන 06 ක මයිලෝ මීටරය වසර 05 ත් 15 ත් අතර කාලයක සිට ක්‍රියාවිරහිතව පැවතුණි. | පිළිගනිමි. මේ වන විට අක්‍රීය තත්ත්වයේ පවතින මයිලෝ මීටර සියල්ල අලුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | මයිලෝ මීටර් අළුත්වැඩියා කළ යුතුය. |

**3.2 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රවර්තන වර්ෂයේ සංවර්ධන කටයුතු 11 ක් වෙනුවෙන් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.30,350,000කින් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් රු.15,972,880 ක් උපයෝජනය කර නොතිබුණි. | රටේ පැවති ආර්ථික අර්බුදය හා උද්ධමනය හමුවේ වියදම් පාලනය කිරිමට චක්‍රලේඛ නිකුත් කිරීම හේතුවෙන් අත්‍යවශය නඩත්තු වියදම් දැරූ අතර, ඇතැම් සංවර්ධන ව්‍යාපෘති තාවකාලිකව නතර කිරීමට සිදුවූයෙන් ප්‍රතිපාදන ඉතිරි වූ බව. | අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුය. |

## 3.3 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසරකට අධික කාලයක සිට සභාව සතු JCB බැකෝ යන්ත්‍රයක්, ට්‍රැක්ටර් රථ 02 ක් සහ වීල් ලෝඩර් යන්ත්‍රයක් අක්‍රීයව පැවතුණි. | පිළිගනිමි. JCB යන්ත්‍රයේ එන්ජිමේ අලුත්වැඩියා කටයුතු කිරීම සඳහා නියෝජිත ආයතනයෙන් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තු මුදල ඉතා අධික බැවින් මේ සම්බන්ධ අලුත්වැඩියා කටයුතු සඳහා බස්නාහිර පළාත් බඳ මාර්ග සංවර්ධන අධිකාරි (ගම්පහ) වෙත යොමු කර ඇති බව. | යන්ත්‍රය කඩිනමින් අළුත්වැඩියා කරගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂය සඳහා සභාවේ ඉදිකිරීම්, කර්මාන්ත පොදු පහසුකම් සහ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව විගණනය කළ යුතු අතර අභ්‍යන්තර විගණනය ශක්තිමත් කළ යුතුය. |